විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
வெளிநாட்டுவளங்கள்திணைக்களம்
Department of External Resources

මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය (3 වැනි මහල), තැ.පෙ. 277,කොළඹ00100, ශ්‍රී ලංකාව

நிதிஅமைச்சு
செயலகம் (3ஆம் மாடி),த. பெ. இல. 277, கொழும்பு 00100,இலங்கை

Ministry of Finance
The Secretariat (3rd Floor), P.O. Box 277, Colombo 00100, Sri Lanka

Web Site:www.erd.gov.lk **e-mail:**info@erd.gov.lk

පුවත්පත් නිවේදනය

මොරටුව විශ්ව විද්‍යාලය සඳහා වෛද්‍ය පීඨයක් ඉදිකිරීම සහ උපකරණ සැපයීමේ ව්‍යාපෘතිය සඳහා කුවේට් දිනාර් මිලියන 10 ක් (රුපියල් මිලියන 6,600 ක) කුවේට් ණය ආධාර

වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රමිතිය සහ ප්‍රවේශය ඉහළ නැංවීම සහ රට තුළ වෛද්‍ය සේවා වෘත්තිකයින්ගේ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම තුළින් ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික හා මානව ප්‍රාග්ධන සංවර්ධනය සඳහා වෛද්‍ය පීඨයක් මොරටුව විශ්ව විද්‍යාලයේ ස්ථාපනය කිරීමට නියමිතය.

ඉහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘතියට මුදල් යෙදවීම සඳහා කුවේට් දිනාර් මිලියන 10 ක (ආසන්න වශයෙන් රුපියල් මිලියන 6,600) ණය මුදලක් ලබා දීමට අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවේට් අරමුදල එකඟ වී තිබේ.

මෙම පීඨය කළුතර ශික්ෂණ රෝහල අසල ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇති අතර, ව්‍යාපෘතිය යටතේ වෛද්‍ය පීඨය සඳහා නව ගොඩනැගිලි සංකීර්ණය සහ අනෙකුත් යටිතල පහසුකම් ඉදිකිරීම, අධ්‍යාපනික ගෘහ භාණ්ඩ හා මෙවලම් සැපයීම, විද්‍යාගාර උපකරණ සහ වෙනත් භාණ්ඩ සැපයීම ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතිය 2022-2026 කාලය තුළ අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කෙරේ.

මෙම ණය ආධාර සඳහා අදාළ ණය ගිවිසුම 2022 පෙබරවාරි 03 දින, මුදල් අමාත්‍යාංශයේදී ගරු මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මහතාගේ හා කුවේට් තානාපති අතිගරු කාලාග් ඇම්.ඇම්.බූ ඩේර් මහතාගේ සහභාගීත්වයෙන් අත්සන් කළ අතර, ඒ සඳහා ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයේ ලේකම් එස්. ආර්. ආටිගල මහතා සහ කුවේට් අරමුදල වෙනුවෙන් එහි නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නෙඩාල් ඒ. අල්. ඔලායාන් මහතා අත්සන් තබන ලදි.

මුදල් අමාත්‍යාංශය
කොළඹ 01
2022 පෙබරවාරි 03 දින.

අධ්‍යක්ෂ ජනරාල் பணிப்பாளர் நாயகம் Director General 94-11-2484693 94-11-2434876
කාර්යාලය அலுவலகம் Office 94-11-2484500 94-11-2484600 94-11-2484724
ෆැක්ස් අංකය தொலைநகல் Fax 94-11-2447633